# ජාතික මෝස්තර මධ්‍යස්ථානය

## කර්මාන්ත අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා සේවා සපයන රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මධ්‍යස්ථානයේ පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - සභා මණ්ඩල ලේකම්** **JM (1-1) (තනතුරු සංඛ්‍යාව 01)**

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන් (පහත 01, 02 හෝ 03)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය/ කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / කලා උපාධිය

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් ක්ෂේත්‍රයට අදාළ 6 වන මට්ටමට නොඅඩු වෘත්තීය පුහුණු සහතිකය

**සහ**

ක්ෂේත්‍රයට අදාළ වසර 05 පළපුරුද්ද

3) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් ක්ෂේත්‍රයට අදාළ 5 වන මට්ටමට නොඅඩු වෘත්තීය පුහුණු සහතිකය

**සහ**

**ක්ෂේත්‍රයට අදාළ වසර 10 පළපුරුද්ද**

**වයස** - වයස අවු. 22 ට නොඅඩු හා වයස අවු. 45 නොවැඩි විය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

**වැටුප් පරිමාණය -** JM 1-1 (42,600 – 755 x 10 - 1,135 x 18 – 70,580/=)

**සටහන :** සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ආයතනය විසින් ගෙවනු ලබයි. සේවකයන් විසින් අර්ථසාධක අරමුදල් සඳහා 8% කින් දායක විය යුතුය.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායාස්ථ සමග **2024.01.19** දිනට පෙර අයදුම්පත් සභාපති, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නො. 10, ද මැල් පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, තමන් පිළිබඳ දන්නා ඥාති සම්බන්ධතාවක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකයන් අයදුම්පතේ සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සභා මණ්ඩල ලේකම්"** ලෙස සඳහන් කළ යුතුයි. අදාළ සහතිකවල ඡායාස්ථ නොමැති අයදුම්පත් භාරගනු නොලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**සභාපති**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය,**
**නො.10, ද මැල් පාර,**
**කටුබැද්ද, මොරටුව.**